# ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව.
## ප්‍රධාන කාර්යාලය
## ඇබෑර්තු

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ පහත සඳහන් තනතුර සඳහා බඳවා ගැනීම පිණිස, ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | ශ්‍රේණිය | වැටුප |
|---|---|---|
| ගණකාධිකාරී | ඒ-5 | රු.127120- 157895<br>5x1695 :10x2230 |

**පත්වීමේ ස්වභාවය** - ස්ථිර පදනම

**<u>තනතුරට අදාළ සුදුසුකම්</u>**

1. පහත සඳහන් ගණකාධිකාරී ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය සමඟ අවුරුදු 02 ක විධායක මට්ටමේ පළපුරුද්දක් තිබිය යුතුය
   - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය (ICASL)
   - මහා බ්‍රිතාන්‍යයේ කළමනාකාර ගණකාධිකාරීන්ගේ වරලත් ආයතනය(CIMA-UK)
   - මහා බ්‍රිතාන්‍යයේ වරලත් සහතික ලත් ගණකාධිකාරීන්ගේ ආයතනය (ACCA-UK)

නැතහොත්,

2. ඉහත සඳහන් ගණකාධිකාරී ආයතනයකින් ලබා ගත් මධ්‍ය පරීක්ෂණ සාමාර්ථය හෝ ඒ හා සමාන අන් සුදුසුකමක් සමඟ ගණකාධිකරණය පිළිබඳ අවුරුදු 07 ක විධායක මට්ටමේ පළපුරුද්දක් තිබිය යුතුය.

**<u>වයස් සීමාව</u>**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 45 ට නොවැඩිවීම (රජයේ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**<u>කාර්ය ක්ෂේත්‍රය</u>**

1. මාසික, ත්‍රෛමාසික හා වාර්ෂික ගිණුම් පිළියෙළ කිරීම
2. ගිණුම් කරන ප්‍රමිතීන්ට ( LKAS/IFRS ) බදුකරණය ( TAX Law ) පිළිබඳ මනා අවබෝධයක් තිබිය යුතුය.
3. ණය වර ලිපි ආශ්‍රිත වැඩ කටයුතු
4. මුදල් කළමනාකරණය ( Treasury Management )
5. පිරිපහදු පිරිවැය වාර්තා සැකසීම හා මාසික සාකච්ඡාව වලට සහභාගීවීම
6. සේවක පඩිනඩි සැකසීම හා ගෙවීම් කිරීම
7. ටෙන්ඩර් මණ්ඩල වලට සහභාගී වීම
8. තෙල් ගිණුම් කටයුතු සැසඳුම් කිරීම
9. SAP පද්ධතියේ Finance Module (මූල්‍ය) Sales & Distribution Module (විකුණුම් හා බෙදාහැරීම්), Material & Maintenance Module (ද්‍රව්‍ය හා කළමනාකරණ) මඟින් කටයුතු කිරීමේ මනා හැකියාවක් තිබිය යුතුය.

....02

**පොදු අවශ්‍යතා**

- යහපත් චරිතයකින් හෙබි වීම.
- මෙම තනතුරේ කාර්යභාරය සහ වගකීම දැරීම සඳහා කායික සහ මානසික යෝග්‍යතාවයන් පැවතීම.
- දැන්වීමේ සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට හෝ ඊට පෙර අවශ්‍ය අවම සුදුසුකම් හා පළපුරුද්ද ලබා තිබීම.
- ඉංග්‍රීසි භාෂා නිපුණත්වය සහ පරිගණක සාක්ෂරතාවය පිළිබඳ අවබෝධය

**අමතර ප්‍රතිලාභ**

සංස්ථාවේ වෛද්‍යාධාර ක්‍රමය යටතේ නොමිලයේ වෛද්‍යාධාර පහසුකම්, නිවාස ණය පහසුකම් , වාහන ණය පහසුකම් යනාදිය හිමිවනු ඇත.

සේවක අර්ථසාධක අරමුදල් සාමාජිකත්වය සඳහා සේවකයා තම වැටුපෙන් 10% ක ප්‍රමාණයකින් දායක විය යුතු අතර, ඒ සඳහා සංස්ථාවෙන් 15% ක ප්‍රමාණයක් ගෙවනු ලැබේ. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල වෙනුවෙන් වැටුපෙන් 3% ක ප්‍රමාණයක් සංස්ථාවෙන් ගෙවනු ලැබේ.

**අයදුම්කිරීමේ පිළිවෙල.**

සංස්ථා වෙබ් අඩවියේ (www.ceypetco.gov.lk ) පළ කර ඇති පොදු අයදුම්පත්‍රයේ ආකෘතිය භාවිතා කර ඔබ විසින් සකස් කරන ලද අයදුම්පත්‍රය සමඟ අධ්‍යාපන සහතිකවල පිටපත් අමුණා ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සහිතව විස්තරාත්මක අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු වේ.

රජයේ දෙපාර්තමේන්තුවල හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානියා මගින් යොමු කළ යුතු අතර, ඔවුන් විසින් අදාළ අයදුම්කරු මෙම තනතුරට තෝරා ගනු ලැබුවහොත්, තම ආයතනයෙන් මුදා හැරීමට ඇති හැකියාව සඳහන් කළ යුතුය.

අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ තනතුරු නාමය සඳහන් කර, 2018.04.16 දිනට හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

ඉහත අවශ්‍යතාවන්ට නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සභාපති
ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව.
අං.ක.609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09.

2018.03.29 දින,
එස්/එස්